උන්නේ, අර තරබාරු තරුණයාය. ඔහුගේ දෑසෙහි වූයේ අප්‍රසන්න බවෙකි. මුහුණෙහි වූයේද රෞද්‍ර පෙනුමකි.

"ඔයාට ඕනද අර පෝනිටේල් කාරයව මීට් වෙන්න...."
රිදීමාගේ හදවත නැවතුණේය. ඊළඟ මොහොතෙහි එය දඩිබිඩි ගා ගැහෙන්නට පටන් ගත්තේය. එය ගැහෙනා හඬ පිටතට ඇසෙතැයි ඈ බියවූවාය.

"වැඩේ දුරදිග යන්න කලින්, මිනිහට කතා කළොත් හොඳයි." කියමින් ඔහු ආපසු හැරුණේය. දුරදිග යන වැඩය කුමක්දැයි නොඅසාම , රිදීමා ඔහු පස්සෙන් වැටුණාය. හරියට මෝහනයට පත් වූ එකියක මෙනි.
පුස්තකාලය දෙසින් කවුදෝ දිව එන හඬක්ද, කෑ ගසන හඬක් ද ඇසුණේය.

"රිදීමා කොහෙද ඔය යන්නේ ?" ඒ මහීකාය.
එහෙත් එයට පිළිතුරු දීමටවත්, නැවතීමටවත් රිදීමාට ශක්තියක් වූයේ නැත. ගල්කැට කිහිපයක් ඇගේ පයේ හැපී විසිර ගියේය. ඉක්මන් ගමණින් දිව ගිය තරුණයා පසුපස ඇයද දිව ගියාය.

"ඔහොම පොඩ්ඩක් ඉන්න ! මමත් එනවා......"
ඒ හඬ රිදීමාගේ දෙසවන් දෝංකාර දුන්නේය. ඒ මහීකාගේ කටහඬ නොවේ. වෙනත් කාගෙදෝ කටහඬකි.

"ඔහොම පොඩ්ඩක් ඉන්න ! මමත් එනවා......"
තරුණිය මුදා හළ වරලස ඇතිව පහත් බංකුවක හිඳ සිටියාය. සුබරත්න මැණිකේ මුදුව කඩා හැලුන එය හිමිහිට පීරුවාය.
"සුදු මැණිකෙගේ කොණ්ඩේ තියෙන ගැට..."
ඈ නෝක්කාඩු කීවාය.

උයනගෙය දෙසින් පිටි කොටන හඬක් ඇසුණේය. උදෙන්ම ආප්ප සෑදීම සඳහා පිටි කොටා දීමට ඇවිත් ඉන්නේ සිරිපනාය. තරබාරු ඇගේ උකුල, පිටි කොටනා විට ගැස්සෙන අයුරු මෙනෙහි කළ තරුණිය දඟ හඬින් සිනාසුණාය.

"සුදු මැණිකේ විසේ නොකර ඉන්නකො !
"ස්.... ස්...." මිදුල දෙසින් හඬක් ආවේය.
"මොකද මේ පුංචි කෙල්ල එළියේ ඉඳන් 'සුස්, සුස්' ගාන්නේ ?"
සුබරත්න මැණිකේ ඇසුවේ හොඳ හිතකින් නොවේ. තරුණිය ඉද්ද ගැසුවාක් මෙන්, ලොවි බංකුවෙන් නැගී සිටියාය. අහිංසක සුබරත්න මැණිකේ නොවැටී බේරුණේ වාසනාවට ය.

"මොකද පිංචි ?"
පිංචි කෙල්ල ඇස් කරකවා ඉඟියක් කළාය.
"ඉන්න සුබේ මේ කෙල්ලට හොඳවැයින් දෙකක් ඇනලා එනකල් !"
තරුණිය තම දිගු වරලස ගෙල මුලට ගැට ගසා ගත්තාය. වෙරළු ගසට පිටුපසින් සිටි පිංචි ඇයට රහසින් යමක් පැවසුවාය. තරුණියගේ මුහුණ වෙනස් වූයේය. මුවගට සිනහවක් නැගිණි.

"යමං..... " ඈ දුවන්නට පටන් ගත්තාය.
වෙල් යාය අයිනෙන් වැටී තිබූ අඩිපාර කෙළින්ම වැටුණේ, ගඟ අද්දරටය. තරුණිය ඉගිලෙද්දී, පිංචි කෙල්ලද ඇය පසු පස ඉගිලුණාය.

ගුරුපාරෙහි වූ ගල්, බොරළු තරුණියගේ පයෙහි වැදී විසිර යනු රිදීමා දුටුවාය. ඇයට වේදනාවක් දැනුණු බවක් නොපෙණුනේය. ඉතා සෙමින් පටන්ගත් රූප රාමු පෙළ, ඉතා සීඝ්‍රයෙන් අවසන් වෙමින් තිබුණේය.
රිදීමා, තරබාරු තරුණයා පසුපස, නතර වූවාය. පිට්ටනියෙහි කොණක වූ පොකුණ අසල හිඳ සිටියේ ඔහුය. මුදාහල ඔහුගේ වරළ සුළඟින් අවුල් විය. කණෙහි වූ කරාබුව දිලිසුණේය. ඔහු හිඳ සිටියේ වාත්තු කළ පිළිමයක් සේ නොසෙල් වී ය. ඔවුන්ගේ හඬ ඇසුණු හේ හිස සෙමින් ඔසවා බැලුවේය.
පියකරු ඒ මුහුණේ, සිනහවක් නොවීය. ආත්ම ගණනාවක කතාවක් පැවසූ දෑසෙහි වූයේ, කියා නිම කළ නොහැකි වේදනාවකි. නිහඬව ඔහු අසන පැනයට දිය යුතු පිළිතුරක් ඇය සතු නොවීය.

"ඔහොම ඉන්න ! ඔහොම ඉන්න !" කවුදෝ පිටුපසින් හිඳ කෑ ගෑවේය.
තරුණයා හිඳ සිටි පඳුරෙන් මෑත්ව නැගී සිටියේය.

"නිශ්ක...... " රිදීමාගේ හදවත මොර ගෑවේය.

"නි....ශ්.....ක......" රිදීමා කෑ ගෑවාය.
පල්ලමේ පහළට පෙරළී ගිය ඇයව, නිශ්ක තම ශක්තිමත් බාහු යුගලට මැදි කර ගත්තේය.

ළබන කළාපයට

සන්නස
අන්තර්ජාලයෙන් කියවන්න
www.sannasa.net



# මහා පරිනිර්වාණ සූත්‍රයෙන් හෙළිවන ධම්මාදාස න්‍යාය

ජර්මනියේ මයින්ස් නුවර යොහානස් ගුටන්බර්ග් සරසවියේ කථිකාචාර්‍ය
පූජ්‍ය රත්මලේ පුඤ්ඤරතන හිමි

වර්තමානය පිළිබද බොහෝ දෙනෙකුට ඇත්තේ අතෘප්තියකි අසහනයකි ඒ නිසාම ඔවුන් අනාගතය පිළිබද දැනගන්නට දක්වන්නේ අසීමිත කැමැත්තකි එය මිනිස් ස්වභාවයයි

බුදුරදුන් දවසද සමහරෙක් උන්වහන්සේ වෙත ඇදී ආවේ උන්වහන්සේ දෙසූ ධර්මය ශ්‍රවනය කිරීමට පමණක් නොවේ තම තමන්ගේ එදිනෙදා ගැටලුවලට මෙන්ම තමන්ට පහසුවෙන් විසදා ගත නොහැකි එසේත් නැත්නම් තම ඉන්ද්‍රියනට ගෝචර නොවන ගැටලුවලටද උන්වහන්සේ ගෙන් විසදුමක් බලාපොරොත්තුවෙනි එහිදී බොහෝ දෙනෙකුට බලපෑ ප්‍රධාන ගැටලුවක් වූයේ තම මියගිය ඥාතීන් ගත කරන්නේ කෙබදු ජීවිතයක්ද යන්න දැන ගැනීමටයි වර්තමාන සමාජයේද මේ පිළිබදව උනන්දුවක් දක්වන්නවුන් නැතුවා නොවේ

කෙසේ වෙතත් බුදුරදුන්ගේ අවසන් දෙසුම ලෙසින් සම්භාවනාවට පාත්‍රව ඇති මහා පරිනිර්වාණ සූත්‍රය තුළ මේ පිළිබද කදිම විස්තරයක් ඉදිරිපත්ව ඇති බව දැකිය හැකියි සාතිශය ධර්ම සංවේගයට තුඩු දෙන සිදුවීම් රැසක් කැටිවුනු මෙම සූත්‍රය බුදුරදුන්ගේ අවසන් සති කීපය ධර්ම කාරණාවන්ට මුල් තැන දෙමින් ඒවාට පිළිතුරු දෙන්නට කැප කොට ඇති ආකාරය සිත් ගන්නා සුලු අයුරින් මෙහි විස්තර වේ
බුදු පියාණන් වහන්සේ දීර්ඝ චාරිකාවකින් පසු භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා සිව්වණක් පිරිසද පිරිවරා නාදිකාවට වැඩම කෙරෙති එහිදී සමකාළීනව අභාවයට පත් යෝගීන් මෙන්ම සාමාන්‍ය ජනයා පිළිබදව නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන ආනන්ද හිමියන් ඔවුන්ගේ මතු භවය කිනම් ස්වභායක් ගෙන ඇත්දැයි බුදුරදුන් ගෙන් විමසා සිටී එකී ගැටලු ආනන්ද හිමියන්ගේ පෞද්ගලික ගැටලු නොවුනද බොහෝ දෙනාගේ ඉල්ලීම පිට මෙසේ ඉදිරිපත් කරන්නට යෙදුන බව අප අමතක නොකල යුතුය.
ඉහත සියලු ප්‍රශ්නයන්ට මහා කරුණාවෙන් පිළිතුරු දෙන තථාගතයන් වහන්සේ ,ආනන්ද මිනිසෙක් මැරේය යන්න ආශ්වර්ය්‍යක් නොවේ එහෙත් ආනන්ද ඒ ඒ දෙනා මළ කල තථාගතයන් වෙත අවුත් ඒ ගැන විචාරීම උන්වහන්සේට වෙහෙස ගෙන දෙන්නකි ඒ නිසා ආනන්ද මේ සදහා ධම්ම දාස නම් වූ ධර්ම ක්‍රමයක් දෙසන්නෙමි, යනුවෙන් ධම්මා දාස න්‍යාය පහදා දෙති

බුදුරදුන්ගේ අවසන් සති කීපය කාලය කළමණාකරණය කරගනු වස් බොහෝ ගැඹුරු ධර්ම කාරණාවන් පවා ඉතා සංක්ෂිප්තව දේශනා කරන්නට වග බලා ගත් බැවින් මෙවන් සදූපදේශයක් පැනවීම අතිශයින්ම සාධාරණය.

ධම්මා දාස යනු දහම් කැඩපතයි යමෙක් ධර්මයෙහි හැසිර ධර්මය ප්‍රගුණ කෙරේ නම් ඔහුට කණ්ණාඩියක් ඉදිරිපිට සිටින්නෙකුට තම පිළිබීඹුව මනාව දැකිය හැකි වනවාක් මෙන් සියලු තතු තම ප්‍රත්‍යක්ෂයට හසුකරගත හැකි බව මෙහිදී විස්තර කර දෙනු දැකිය හැකියි එකී ධම්මා දාස න්‍යාය ප්‍රගුණ කල යුත්තේ කෙසේදැයි විස්තර කෙරෙන මහා පරිනිර්වාණ සූත්‍රය තෙරුවන් පිළිබදව කරුණු මනාව දැන දැක ඇති කරගන්නා පැහැදීම තුළින් එකී ධම්මාදාසයට ප්‍රවේශ විය යුතු බව පෙන්වා දෙති එසේ ඇති කර ගන්නා දැඩි ශ්‍රද්ධාව මගින්

1 සක්කාය දිට්ඨි
2 විචිකිච්චා
3 සීලබ්බත පරාමාස
යන ප්‍රධාන සංයෝජනයන් ප්‍රහීන කල හැකියි

පුද්ගලයා සසරට බැද තබන බැදීම් හෙවත් සංයෝජනයන් 10 ක් පිළිබද සාකච්ඡා කරන බුදුසමය එකී සංයෝජනයන් අනුපිළිවෙළින් ප්‍රහානය කිරීම තුළින් සංසාර විමුක්තිය සාක්ෂාත් කර ගත යුතු බව අවධාරණය කොට සිටී එහි පළමු පියවර වන්නේ ඉහත සංයෝජනත්‍රය මුළිනුපුටා දැමීමය

නව අරහාදී බුදු ගුණාල තෙසැත්තෑවක් වූ මහා ඥාණ ගුණ වැනි ලොව්තුරා බුදුපියාණන් වහන්සේ ගේ අපමණ ගුණ කදම්බයත්ල පුරා පන්සාළිස් වසක් උන්වහන්සේ දෙසූ සුවාසූ දහසක් ධර්මස්කන්ධයෙහි බල මහිමයත්ල බුදුන්ල දහම් අනුව ගිය මහ සගරුවනේ සුපටිපන්නතාදී අමිත ගුණයනුත්ල සිහි කිරීමෙන් තමන් පිළිබදව දරණ මමත්වය කැටිවුනු සියලු සංකල්පයන්ගෙන් මිදීල සියලු ආකාර සැක කිරීම්වලින් බැහැරවල බුදුන්ල දහම් සගුන් හැර වෙනත් මගක් තමන්ට නැතැයි යන බලවත් විශ්වාසය ආර්ය්‍ය මාර්ගයට අපව අවතීර්ණ කරවතිග තවත් අයුරකින් පවසතොත් තෙරුවන් පිළිබද අචල ශ්‍රද්ධාවල සසර බැම් ලිහන්නට අතිශයින්ම අත්‍යාවශ්‍යයග එය බුදුරදුන් ගේම වචනවලින් ප්‍රකාශ කරන්නේ නම් ,නියතව සම්බෝධියට යොමු කරන සෝවාන් බවට පත් වූයේ වෙමැයි තමා විසින් තම තතු පළ කළ හැකි වන ධම්මාදාසයට පත්වීමයි"

ධම්මාදාස න්‍යාය මගින් බුදුරදුන් පෙන්වා දීමට උත්සාහ කලේ අනෙකක් නොව උන්වහන්සේ දේශිත ධර්මයල මේ බවයෙහිම ඵල දැකිය හැකි :සංදිට්ඨික* කල් නොයවා විපාක දෙන :අකාලික* නුවණැත්තන් විසින් ප්‍රත්‍යක්ෂව දත යුතු :පච්චත්තං වේදි තබ්බෝ* දහමක් බව අවබෝධ කරවීමයි.

වර්තමාන සමාජය කොතෙක් දුරට බුදුරදුන් පෙන්වා වදාළ මෙම ධම්ම න්‍යාමයල තම ප්‍රායෝගික ජීවිතයට එක්කර ගෙන ඇත්දැයි විමසීම කාලෝචිතයග අවාසනාවකට මෙන් අද යුගයේ බොහෝ දෙනෙකු තමන් පිළිබදව එසේත් නැත්නම් තමන් තුල ඇති මානසික ශක්තින් පිළිබදව පැහැදිළි විශ්වාසයකින් ක්‍රියා කරන බවක් නොපෙනේග ඒ නිසාම විවිධාකාර තැරව්කරුවන්ටල ඊනියා වාසනාව ළගාකර දෙන්නේයැයි කියන්නවුන්ටල දෙනු ලබන පුද පිදේනිවල අඩුක් නම් නැතග එවන් ,වෙළෙන්දන්, කිසිදු හිරිකිතයකින් තොරව මුද්‍රිත මාධ්‍යයද අභිබවා විද්‍යුත් මාධ්‍යයද මුදලට ගෙන ඇති ආකාරය නිරන්තරයෙන් අද යුගයේ දැකිය හැකිය.

මහා පරිනිර්වාණ සූත්‍රය මගින් සෘජු ලෙසම ධම්මා දාස න්‍යාය පෙන්වාදිමට උත්සාහ ගත් බුදුරදුන් එමගින් තම තමන්ම ධර්මය තේරුම් ගැනිමටත් ඒ අනුව ජීවිතයේ එදිනෙදා ගැටලුවලට මෙන්ම සාංසාරික ගැටලු වලටද පිළිතුරු සොයා ගැනීමට උත්සාහවත් විය යුතු බවත් අවධාරනය කොට සිටියහ.

මහා පරිනිර්වාණ සූත්‍රය පිළිබද සාවධානවීමේදී ප්‍රස්තුතයට අදාළ තවත් කරුණු කාරණා බොහොමයක් ඉදිරිපත්ව ඇති බව පැහැදිළිය ඒ අනුව පිරිනිවනට මාස 3 කට පෙරාතුව බේලුව ගමට වැඩි බුදුපියාණන් වහන්සේ එහිදී මාරක රෝගයකට මුහුණ දුන්හග උන්වහන්සේ තුළ වූ අසමසම අධිෂ්ඨානයත් වීර්ය්‍යයත් නිසා එකී රෝගය යටපත් කර දැමීමට සමත් වුවද එයින් උන්වහන්සේ බලවත් ලෙස අබලන් වූ බව පෙනේ. බුදුපියාණන් වහන්සේ ගේ දැඩි ගිලන් බවින් කම්පාවට පත්වන ආනන්ද හිමියන් ,තමන්ට යම් තරමක හෝ අස්වැසිල්ලක් ඇත්තේ භික්ඛු සංඝයා ඉදිරියේ අවසන් වදන් ප්‍රකාශ නොකොට බුදුරදුන් පිරිනිවනට නොවඩිනා බව තමන්ට ප්‍රත්‍යක්ෂ නිසා යැ,යි ප්‍රකාශ කොට සිටී ලොව්තුරා බුදුපියාණන් වහන්සේ මෙහිදී ආනන්ද හිමියන් අමතා කරනු ලබන ප්‍රකාශය ලෝක ඉතිහාසයේ කවර ආගමික ශාස්තෘවරයෙක හෝ දාර්ශනිකයෙකු වෙතින් ප්‍රකාශ වූවක් නොවේ. එකී ප්‍රකාශය තුළින් බුදුසමයෙන් නිර්දේශිත සැබෑ නිදහස් නිවහල් චින්තනය හා ප්‍රජාතාන්ත්‍රීය බව මොනවට පැහැදිළිය.
ඉතා මුදු මොලොක් බසින් ආනන්ද හිමියන් විමසන උන්වහන්සේ ,තමන් කිසිදු ගුරු මුෂ්ටියක් තබා නෙගෙන නෙසගවා නොවළහා ධර්මය දේශනා කල බවත් ඇරත් භික්ඛු සංඝයා පරිහරනයට හෝ භික්ඛු සංඝයා තමන් වහන්සේ උදෙසා පැවතිය යුතුයැයි යන අදහසක් හෝ තමන් වෙත නැතැ,යි දේශනා කරති

එබැවින් අත්ත දීපා විහරථ - අත්ත සරණා අනඤ්ඤ සරණා
ධම්ම දීපා විහරථ - ධම්ම සරණා අනඤ්ඤ සරණා

යන මහා පරිනිර්වාණ සූත්‍රයේ දෙසුම් මගින් තමා තමන්ට දිවයිනක් කොට ගෙන අන් අයගේ සරණ නොසොයා තමන්ම තමන්ට සරණක් කොට ගෙන දහම සරණක් කොට ගෙන ජීවත් විය යුතු බව අවධාරණය කොට ඇත. එමගින් උන්වහන්සේ වැඩි දුරටත් පැහැදිළි කර දෙන්නේ අප අපගේම දෙපයින් නැගී සිටින්නට උත්සාහවත් විය යුතු බවයිග මන්ද තවත් අයෙකුගේ අධාරයකින් හෙවත් මුක්කුවකින් ජීවත් වන්නට සිදුවුව හොත් එකී මුක්කුව ගැලවී ගිය කළ ඔහු එහෙම පිටින්ම බිම ඇද වැටිය හැකි බැවිනි. දැඩි ආත්ම ශක්තියෙන් හා ආත්ම විශ්වාසයෙන් කටයුතු කරන්නාට ජය මෙන්ම පරාජය හමුවේද නොසසලව ජයග්‍රාහී ලෙසින් ජීවිතයට මුහුණ දිය හැකි වන අතර ජීවිතයකට එළඹිය හැකි අභියෝගයන් සාර්ථකව ජයග්‍රහණය කරා යොමු කරවිය හැකිය.

බුදු මුවින් දෙසූ සදහම් පිළිබදව වැඩි වැඩියෙන් සිතන්නට අපව යොමු කරවන මෙම අසිරිමත් වෙසක් සමයේ සම්බුදුරදුන් දෙසූ මෙම ධම්මා දාස න්‍යාය ඔබේ දිවි මග පහන් කරනා මහා ආලෝකයක්ම වේවා ■


කොතැන සිටියත් සූරිය ඔබේ වෙළඳසලයි
කාන්සියට, රස වින්දනයට සිංහල ටෙලි නාට්‍ය
බටහිර ඔස්ටේලියාව, දකුණු ඔස්ට්‍රේලියාව, තස්මේනියාව, ක්වීන්ස්ලන්තය, නිව් සවුත් වේල්සය, කැන්බරා, වික්ටෝරියා ඔස්ට්‍රේලියාවේ කොයි අස්සක මුල්ලක හිටියත් ඔබට අවශ්‍ය සිංහල ටෙලි නාට්‍ය තැපෑලෙන් ගෙන්වා ගන්න...
අප අමතන්න
03 9465 8257
සූරිය
Sooriya
ඔබේ වෙළඳ සල
* conditions apply
132 - 1B Alexander Av Thomastown Vic 3074 Tel - 9465 8257
www.sooriya.com.au
සූරිය - හිරු මෙන් විශ්වාසයි